**ජාතික ලොතරැයි මණ්ඩලය - 2020**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත Sage ACCPAC නැමැති පරිගණක මෘදුකාංගය 2016 වර්ෂයේදී විමධ්‍යගත කර තිබීම හේතුවෙන් එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, වරින්වර අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම භාරගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් | මධ්‍යගත Sage Accpac පරිගණක මෘදුකාංගය භාවිත කිරීමේදී සිදුවූ ණයහිමි පාලක ගිණුමේ ශේෂයක් ප්‍රධාන ජර්නලයේ ඉතිරි වී ඇති බැවින් මෙවැනි ගණුදෙනු සිදුවීම් ඉදිරියේදී වලක්වා ගැනීම සඳහා පද්ධතියට අලුතින් එකතු කරන ලද මොඩියුලයන් ප්‍රධාන ජර්නලයෙන් ඉවත් කර වෙන් වෙන් වශයෙන් පද්ධති දෙකක් ලෙස දැනට භාවිතා කරනු ලබයි. මේ හේතුවෙන් ඇතැම් අභ්‍යන්තර පාලන ගුණාංගයන් ඉවත්වීම නිසා ඇතැම් පහසුකම් අක්‍රිය වී ඇති හෙයින් ප්‍රායෝගික ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා | පරිගණක මෘදුකාංග පද්ධතිය හා පරිගණක ආරක්ෂණ පද්ධතිය යාවත්කාලීන නඩත්තු කර වඩාත් විශ්වාසනීයද අරමුණුගත කාර්යයන් ඉටුවන අයුරින් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය. |

| | | |
|---|---|---|
| මෘදුකාංග නඩත්තුව වෙනුවෙන් රු.13,931,289 ක මුදලක් දරා තිබුණද, මෙම මෘදුකාංගය වෙනුවෙන් පරිගණක ආරක්ෂණ පද්ධතියක්ද නඩත්තු කර නොතිබුණි. විගණිත දින වනවිට Sage ACCPAC පරිගණක මෘදුකාංගය බිඳවැටීමකට ලක්ව මණ්ඩලයේ ගිණුම් පද්ධතියේ ක්‍රියාකාරීත්වය දැඩි අවධානමකටද ලක්ව තිබුණි. | ගනිමින් මේ වන විට ආරම්භ කර ඇති සමස්ථ ERP පද්ධතිය නවීකරණ වැඩසටහන යටතේ ගැටළු අවම කර ගනිමින් නව මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම සඳහා අවශ්‍ය අධ්‍යනයන් කරමින් පවතී. මෙහි සඳහන් Sage Accpac ERP පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කරනු ලබන නියෝජිත ආයතනය මෘදුකාංගය තුල ඇති අවශ්‍ය ආරක්ෂණ පද්ධති අදාල අනුමත ක්‍රමවේදයන්ට සපයා පවත්වාගෙන ගොස් ඇත. ප්‍රධාන දත්ත පද්ධතියේ ඇතිවූ ඇතැම් බිඳවැටීම් හේතුවෙන් ඇතැම් අවස්ථා වලදී තාවකාලික පද්ධති අක්‍රියවීම් සිදුවී ඇති අතර එම සිදුවීම් මෙම නඩත්තු ගිවිසුමට අදාල නොවේ. | |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16** | | |
| ප්‍රමිතයේ 06 ඡේදය අනුව, දේපල පිරියත හා උපකරණ යන්න, "නිෂ්පාදනයේදී හෝ භාණ්ඩ හා සේවා සැපයීමේදී භාවිතය සඳහා වෙනත් පාර්ශවයන්ට කුලියට දීම සඳහා හෝ පරිපාලනමය කටයුතු සඳහා තබාගෙන ඇති සහ; එක් කාලච්ඡේදයකට වඩා වැඩි කාලයක් තුළ භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම්" ලෙස දක්වා තිබුණද, මණ්ඩලය විසින් ඊට පටහැනිව, පිරිවැය රු.21,954,215 ක් වූ පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට, දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | මණ්ඩලය වෙනුවෙන්ම නිපදවා ගන්නා ලද මෘදුකාංග පමණක් අස්පෘශ්‍ය වත්කම් යටතේ සඳහන් කර ඇති බැවින් දැනට ස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා ඇති අස්පෘශ්‍ය වත්කම් සහ ඉදිරියේදී අත්පත් කරගැනීමට යෝජිත සියළු අස්පෘශ්‍ය වත්කම් ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 16 ප්‍රකාරව ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් ගිණුම් තැබීමේ අවශ්‍යතාවය |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වෙළඳ ණයගැතියන් තුළ ඇතුළත් අධිකරණ ක්‍රියාමාර්ග පැවති අලෙවි නියෝජිතයින් 05 දෙනෙකුගෙන් හා ලොතරැයි අලෙවිය මත වූ | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම සඳහා සටහන් කර ගතිමි. | නිශ්චය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි අඩමාණ ණය වෙන් කිරීමේ අවශ්‍යතාවය. |

ණයගැතියන්ගේ එකතුව රු.11,948,108 ක්වූ ශේෂය සම්බන්ධයෙන් ආයතනයේ අඩමාණ ණය වෙන්කරිරීමේ ප්‍රතිපත්තියට වෙනස්ව යමින් සමස්ථ ශේෂය සඳහාම අඩමාණ ණය වෙන්කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද දිනුම් වාරයන් වෙනුවෙන් වූ ත්‍යාග සඳහා වෙන්කිරීම්වලින් ඉතිරිව පැවති රු.261,676,181 ක මුදල රඳවාගත් ලාභයට හරකර, ත්‍යාග සංචිත අරමුදලට බැරකළ යුතු වුවත්, එය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර, එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී බදු පෙර ලාභයට ගලපා තිබුණි. | සියළුම ත්‍යාග මුදල් අඩුකිරීමෙන් පසු ඉතිරි මුදල් ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලබයි. මෙම අරමුදල ත්‍යාග සඳහා අරමුදල් ලබාගැනීමට පමණක් යොදා ගනු ලබයි. ත්‍යාග සඳහා හිමිකම් නොපෑ ත්‍යාග සංචිත ගිණුමට බැර කර ඇති මූල්‍ය විචලනයක් නොවන රු.261,676,181 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ත්‍යාග වියදම් ගිණුම යටතේ හර කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙම වටිනාකම බදු පෙර ලාභයට ගලපා මුදලින් සිදුවූ විචලනය දක්වා ඇත. | සංචිත අරමුදල් සඳහා මාරු කිරීම් රඳවාගත් ලාභයට හර කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ අලෙවි නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත නොවිකුණූ බව තහවුරු කර තිබුණද භෞතිකව මණ්ඩලය වෙත භාර නොදීම මත ටිකට්පත් 701,206 ක් වෙනුවෙන් දඩ මුදලද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවිය යුතු රු.11,429,657 ක මුදල ගිණුම්වල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි. | රජයේ විගණන අංශය විසින් නොවිකුණූ ලොතරැයිපත් පිළිබඳ අදාල තොරතුරු ලබා දීමෙන් පසුව මෙම ලොතරැයිපත් සඳහා මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. | නොවිකුණූ බව තහවුරු වී ඇති නමුත් භෞතිකව මණ්ඩලය වෙත භාරදී නොමැති ටිකට්පත් වෙනුවෙන් අයවිය යුතු වටිනාකම මණ්ඩලයේ පද්ධතිය මඟින් නිශ්චය කර ගත හැකි බැවින් එම වටිනාකම අයවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය රු.12,996,213 ක් විය. එකී ශේෂය තුළ 2018 වර්ෂයේ සිට විවිධ | මෙම ශේෂයෙන් මාස 06 ඉක්මවූ ශේෂය ඉදිරියේදී මණ්ඩලයේ ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | චෙක්පත් අගරු වීම සම්බන්ධයෙන් විධිමත් පරිදි ගිණුම් තැබීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| | සැපයුම්කරුවන් හා ණයහිමියන් වෙත, චෙක්පත් 235 ක් යටතේ සිදුකළ ගෙවීම් ඇතුළත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අදාල ශේෂයන්, අවලංගු කළ චෙක්පත් ගිණුමෙන් ඉවත්කර, ණයහිමි ශේෂයට එකතුකිරීමට කටයුතු කර නොතිබුණු අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඈ) | එක් අලෙවි නියෝජිතයෙකු වෙත ඉන්වොයිස් කරන ලද ලොතරැයි ටිකට්පත් සඳහා මුදල් ගෙවා නොතිබියදී, 2020 සැප්තැම්බර් මස සිට 2020 දෙසැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ රු.4,687,855 ක මුදලක් තැන්පත් කළ බවට, පරිගණකයට සාවද්‍ය ලෙස සටහන් ඇතුළත් කර, මණ්ඩලයෙන් වංචනිකව ටිකට්පත් මිලදීගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී එලෙස වංචාකර තිබුණු මුදල උපලබ්ධි නොවූ තැන්පතුවල ඇතුලත්ව තිබුණු අතර, ඒ පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුළ කර නොතිබුණි. | මේ පිළිබඳ ආයතනික වශයෙන් මූලික විමර්ශනයක් සිදු කරන ලද අතර විධිමත් විනය පරීක්ෂණය සිදු කිරීම සඳහා පරීක්ෂණ නිලධාරීවරයකු පත් කර මේ වන විට විනය පරීක්‍ෂණ කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම මේ සම්බන්ධයෙන් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර එම විමර්ෂණ කටයුතුද සිදු කරමින් පවතී. වර්ෂය අවසානයේදී එලෙස වංචා කර තිබූ මුදල උපලබ්ධි නොවූ තැන්පතු වල ඇතුලත්ව තිබෙන අතර 2021 වර්ෂයේ ගිණුම් වල මේ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | සිදුකර ඇති වංචාවට අදාල පාර්ශවයන් හඳුනාගැනීමට හා එම වංචාව පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය. |
| (ඉ) | අලෙවි නියෝජිතයන්ගේ ලොතරැයි ආපසු එවුම්වලට අදාලව මණ්ඩලයේ රැස්කිරීමේ ගිණුමේ දැනටමත් බැරවී ඇති මුදල් වටිනාකම් නැවතත් මහජන බැංකු රැස්කිරීමේ ගිණුම හරහා ගැලපීමට තීරණය කර තිබුණි. 2014 වර්ෂයේ සිට 2020 ජුනි දක්වා රැස්කිරීමේ කොමිස් මුදල් ලෙස බැංකුව විසින් රු.18,220,437 ක මුදලක් අයකරගෙන තිබුණි. මෙම මුදල නැවත අයකර ගැනීම සඳහා මහජන බැංකුව සමඟ එකඟතාවයක් ඇතිකරගෙන තිබුණද අදාල මුදල මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | මේ පිළිබඳ මහජන බැංකුව සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වූ අතර, මෙම මුදල නැවත ලබාදෙන ලෙස ලිඛිතව දන්වා ඇත. මේ වන විට මහජන බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් විමර්ශනයක් සිදුකරන අතර, එය අවසානයේ මෙම මුදල මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු යොදමින් පවතී. 2021 අගොස්තු 31 දින තෙක් මේ සඳහා කල් ඉල්ලා බැංකුව විසින් ලිපියක් එවා ඇති අතර කොවිඞ් තත්වය නිසා එය තවමත් අවසන් කර ගැනීමට නොහැකි වූ බව බැංකුව විසින් වාචිකව දන්වන ලදී. ඒ අනුව මහජන බැංකුවේ එකඟතාවය ලැබුණු පසු ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබීමට ඇති මුදල් සම්බන්ධයෙන් එකඟතාවය ලබාගෙන අයකර ගැනීමට කටයුතු කිරීම හා අදාල පරිදි ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ක්ෂණික ලොතරැයිපත් ලබාදුන් අලෙවි නියෝජිතයින්ගෙන් දින 365 ක් ඉක්මවූ ණයගැති වටිනාකම රු.50,744,968 ක් වූ අතර, ඉන් බැංකු ඇපකර සහිත ණයගැති වටිනාකම රු.8,839,957 ක් පමණක් විය. ණයගැති කාලය වසරක් ඉක්මවූ ණයගැතියන්ගෙන් එම අයවිය යුතු මුදල් අයකර ගැනීමට හෝ බැංකු ඇපකර, මුදල් කර ගැනීමට හෝ මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි. | 2020 11.30 දිනට මාස 06 ඉක්මවූ ණයගෙවීම සම්බන්ධව වාරික වශයෙන් ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කර ලිඛිතව අලෙවි නියෝජිතයන් දැනුවත් කරන ලද අතර, 2020 දෙසැම්බර් මස සිට වාරික වශයෙන් ණය අයකිරීම් කටයුතු ක්‍රියාත්මක කර ඇත. | වසරක කාලයක් ඉක්මවා ඇති එම ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමට හෝ බැංකු ඇපකර මුදල්කර ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින වන විට අලෙවි නියෝජිතයින් 764 දෙනෙකුගෙන් අලෙවි කුටි සඳහා අයවිය යුතු ශේෂය රු.5,612,225 ක් විය. එයින් වසර 05 ට වැඩි කාලයට අදාල ශේෂය රු.2,454,363 ක් වූ අතර, එම ශේෂය අයකර ගැනීමට මණ්ඩලය මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම අයවිය යුතු ශේෂයෙන් රු.4,244,451 ක් නියෝජිතයින්ට ගෙවිය යුතු හිඟ දිරිදීමනා මුදලින් අඩුකර ගැනීමට අපේක්ෂිතය. තවදුරටත් අයවිය යුතු රු.1,385,643 ක ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට අපේක්ෂිතය. | මණ්ඩලය විසින් අදහස් දක්වා ඇති පරිදි අප්‍රමාදව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනානොගත් රු.3,585,823 ක බැර ශේෂයක්ද, වර්ෂ 09 කට වැඩි කාලයක සිට ණය හිමියන් 04 දෙනෙකුට ගෙවිය යුතු රු.4,979,245 ක්ද, කාර්ය මණ්ඩලයේ 14 දෙනෙකුට ගෙවිය යුතු රු.169,311 ක මුදලක්ද මූල්‍ය ප්‍රකාශනවල පැවති අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු.3,585,823 ක හඳුනා නොගත් බැර ශේෂය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ. ණය හිමියන්ට ගෙවිය යුතු රු.4,979,245 ක ශේෂය ආදායමට ගැනීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු රු.169,311 ක ශේෂයෙන් රු.35,192 ක් යම් යම් නිර්දේශයන්ට යටත්ව ආදායමට බැර කිරීමට මුදල් අමාක්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. | මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්දේශ/ අනුමැතීන් අනුව අප්‍රමාදව කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) ඡේදය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය | ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ලාභ එකතුව වූ රු.2,486,581,711 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2020 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි. | වර්ෂ අවසානයේ ඉතිරි ලාභය ලෙස පෙන්නුම් කරන ලද එකතුව සම්පූර්ණයෙන්ම මුල්‍යමය වටිනාකමක් නොවන අතර, එම සමුච්චිත ලාභයෙහි ආයතනයේ වත්කම් හා වගකීම් ඇතුලත් වේ. එම සම්පූර්ණ මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ හොත් ආයතනය තුල එදිනෙදා කටයුතු කරගෙන යාමේදි විශාල මූල්‍ය අර්බුදයකට මුහුණපෑමට සිදුවිය හැක . එබැවින් එම සම්පූර්ණ මුදල් රජයේ ඒකාබද්ධ අරමුලට බැර කිරීමට හැකියාවක් නොමැත. | දක්වා ඇති පනත්වල විධිවිධාන පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 14(2), 16(1) හා 16(4) වගන්ති | මණ්ඩලය විසින් අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හා අධිකාරි වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේදී අදාළ ආයතන සමග ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ගොවිසෙත, සුපිරි වාසනා, ජාතික සම්පත, නීරෝගා හා සෙවණ ලොතරැයි වෙනුවෙන් එලෙස ගිවිසුම්ගතවී නොතිබුණි. | මණ්ඩලය විසින් පවත්වනු ලබන දිනුම්වාර වලට අදාල මුදල් ඒ ඒ ආයතන වලට බැර කිරීමකින් තොරව ඒකාබද්ද අරමුදලට බැර කරන බැවින් අදාල ආයතන සමඟ ගිවිසුම්ගතවී නොමැත. | දක්වා ඇති පනත්වල විධිවිධාන පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| | | එසේම, පනතේ විධිවිධාන ප්‍රකාරව, මාස 06 ඉක්මවූ හිමිකම් නොපෑ සියළුම ත්‍යාගවල වටිනාකම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවත් 2019 ජූලි 01 දින සිට 2020 ජුනි 30 දක්වා පැවැත්වූ ලොතරැයි දිනුම් ඇදීම්වලට අදාලව, හිමිකම් නොපෑ රු.7,018,415ක් වූ මුදල්මය නොවන ද්‍රව්‍යමය ත්‍යාග සම්බන්ධයෙන්, | ප්‍රධාන දිනුම් ඇදීමකදී මුදලින් ලබාදෙනු ලබන ත්‍යාග මාස 06 ඉක්මවූ පසු ත්‍යාගලාභීන් විසින් හිමිකම් නොපෑව හොත් එම මුදල මහා භාණ්ඩාගාරයට බැර කර ඇත. ත්‍යාග භාණ්ඩ හෝ ලොතරැයි අලෙවිය වැඩි කිරීම සඳහා ලබාදී ඇති විශේෂ ත්‍යාග මාස 06 දක්වා ලබාදීමෙන් අනතුරුව හිමිකම් | |

| | | | | |
|---|---|---|---|---|
| | | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | නොපැවහොත් ඒවා නැවත මණ්ඩලය වෙත ලබාගෙන ඉදිරි දිනුම් වාර වලදී හෝ විශේෂ ත්‍යාගයන් ලෙස ලබාදීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) හා (3) ඡේද | ලොතරැයි ත්‍යාගලාභීන්ගේ පරිත්‍යාගවලින් සහ නීරෝගා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රතිශතයක් බැර කරමින්, 1998 වර්ෂයේදී මණ්ඩලය විසින් අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ රු.22,484,736 ක ශේෂයක් පැවතුණු අතර, මෙලෙස විශේෂිත අරමුදලක් පවත්වාගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ව්‍යාපාරික ස්වභාවය මත පදනම්ව අලෙවි නියෝජිත හා අලෙවි ජාලයේ හා සාමාජීය සානුකම්පිත අවශ්‍යතා සඳහා 1998වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ පිහිටුවන ලදී. ජාතික ලොතරැයි මණ්ඩලය සෑම ස්ථරයකම සාමාජිකයෙකුම, අනෙකුත් සෑම ලොතරුයියකටම අදාලව ලබාදෙනු ලබන සේවක දිරිදීමනා මුදල මෙම ලොතරැයිය වෙනුවෙන් ඉල්ලුම් කර නොමැත. සේවක දිරිදීමනා ලෙස වෙන්කළ හැකිව තිබූ අලෙවි වටිනාකමින් 0.5% ක මුදලක් අසරණ සරණ අරමුදලට දායක කරන ලදී. | අදාල චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ඇ) | 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/07/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ මෙගා පවර් හා ධන නිධානය යන ලොතරැයි වර්ග 02 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන්, එනම් සියයට 10 ක වටිනාකමක් පමණක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම නිසා, තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකළ වටිනාකම රු.258,274,111 ක් විය. | මෙම ලිපිය මඟින් උපදෙස් ලබාදෙන විට මහජන සම්පත හා වාසනා සම්පත යන ලොතරැයි 02 ක පමණක් පැවතුණි. ඒකාබද්ධ අරමුදලට ප්‍රධානය කරනු ලබන සියයට 16.5 ක ප්‍රතිශතය මූලිකව හේතුවීම නිසා මෙම ලොතරැයි දෙකම මේ වනවිට පාඩු ලබන තත්ත්වයට පත්ව ඇත. අනෙකුත් ආරම්භ කරන ලද නව ලොතරැයි සඳහා ලබා දිය හැකි දායකත්වය අලෙවි ආදායමෙන් 10% | භාණ්ඩාගාර ලිපියේ උපදෙස් පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

ක් පමණක් වන අතර ඊට වඩා වැඩි ප්‍රතිශතයක් ලබාදුනහොත් සියළුම ලොතරැයි අලාභ ලබන තත්ත්වයට පත්වේ. තවද එම ලොතරැයි පවත්වාගෙන යාමටද නොහැකි වන අතර මණ්ඩලය වෙත ලැබෙන ආදායමෙන් අනෙකුත් සියළුම වියදම්ද දරනු ලබයි. මහජන සම්පත හා වාසනා සම්පත ලොතරැයි වල අලෙවි ආදායමින් 16.5% ක ප්‍රතිශතයක්ද, අනෙකුත් සියලු ලොතරැයිවල ආදායමින් 10% ක ප්‍රතිශතයක්ද මාසිකව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරමින් ජාතික ලොතරැයි මණ්ඩලය ලාභ ලබන ආයතනයක් ලෙස පවත්වාගෙන යනු ලබනුයේ දැවැන්ත පරිශ්‍රමයක ප්‍රතිපලයක් ලෙසය. මහා භාණ්ඩාගාරය වෙත අලෙවි ආදායමින් ප්‍රතිශතයක් ලෙස ලබාදෙන මුදල වැඩි කිරීම සිදු කල නොහැකි අතර ලබාදිය හැකි වන්නේ 10% ක ප්‍රතිශතයක් පමණි. තවද මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය ද දැනුවත් කර ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,434,824,231 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,841,111,500 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.406,287,269 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මැද භාගයේදී රට වසා තැබීම නිසා ලොතරැයි අලෙවිය නතරවීම හා ඉන් පසුව ලොතරැයි අලෙවියේ අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

මණ්ඩලයේ 2020 හා 2019 වර්ෂයන්ට අදාළ ලොතරැයිපත් ආදායම හා ප්‍රචාරණ වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.4,038,115,575 කින් හා විකුණුම් පිරිවැය රු.3,131,683,602 කින් පහළ ගොස් තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 18.29 ක් හා 17.34 ක් විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මණ්ඩලයේ විකුණුම්, අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම් රු.614,872,280 කින් හෙවත් සියයට 40.78 කින් අඩු වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ .

| | **අනුපාතය** | **වර්ෂය** 2020 | 2019 |
|---|---|---|---|
| **(අ)** | දළ ලාභ අනුපාතය | 14.89 | 14.09 |
| **(ආ)** | ශුද්ධ ලාභඅනුපාතය | 6 | 4.43 |
| **(ඇ)** | ජංගම වත්කම් අනුපාතය | 2.99:1 | 2.20:1 |
| **(ඇ)** | ක්ෂණික වත්කම් අනුපාතය | 2.96:1 | 2.18:1 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ජාතික ලොතරැයි මණ්ඩලයේ දිනුම් වාරවලින් ඉවත්කරන ලද නොවිකුණු ලොතරැයිපත් ගබඩා කිරීම සඳහා මණ්ඩලය සතු චොක්ෂෝල් වීදියේ පිහිටි ඉඩමේ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ හැකියාව තිබියදී, ඒ සඳහා මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සිට සි/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වර්ග අඩි 3,136 ක ගබඩා ඉඩකඩ ප්‍රමාණයක් කුලියට ලබා ගෙන තිබුණි. එය පසුව වර්ග අඩි 6,217 ක් දක්වා වැඩිකරගෙන ඒ සඳහා වසරකට රු.12,572,495 ක් ගෙවා තිබුණි. | ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් මාසික කුලී පදනම මත ලබා ගෙන තිබූ ගබඩා හතෙන් 2021.04.01දින වනවිට ගබඩා 05 ක් පමණක් මණ්ඩලයේ භාවිතයට ගනු ලැබේ. බැහැර කරනු ලබන ලොතරැයිපත් හා වෙනත් කඩදාසි නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් බැහැර කිරීමේ ආයතනයක් තෝරාගෙන ඔවුන්ට ලබා දිම ක්‍රමවේදය වුවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තෝරාගනු ලැබූ ආයතනය විසින් එම කඩදාසි තොග ගෙනයාම අතරමඟ නවතා දැමීම සිදු කරන ලදී . ඉන් අනතුරුව නැවත වතාවක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ අතර අවස්ථා කිහිපයකදී | මණ්ඩලීය පරිශ්‍රයක විධිමත් පරිදි ආර්ථිකමය අතින් වාසිදායක අයුරින් ගබඩා පහසුකම් ලබා ගැනීමේ කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| | | ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීම , මුලින් ඉදිරිපත් වී පසුව ප්‍රතික්ෂේප කිරීම් වැනි විවිධ හේතු නිසා ප්‍රසම්පාදනයෙන් ගැනුම්කරුවෙකු තෝරාගැනීමට බොහෝ කාලයක් ගතවිය. එම හේතුවෙන් මෙම කඩදාසි තොග ගබඩා කර තබා ගැනීමට සිදුවිය. නමුත් 2020 වර්ෂයේදී නව ගැණුම්කරුවෙකු තෝරාගෙන ඔහුට එම තොග ලබා දීම නිසි පරිදි සිදුකරගෙන යනු ලබයි . | |
| (ආ) | මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි ඉඩමේ ව්‍යාපාරික පරිශ්‍රය ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි ඉදිකිරීම් සිදු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන අනුව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් කෙරීගෙන යන වැඩ (Working Progress) ලෙස රු.මිලියන 27,003,862 ක් වියදම් කර ඇත. එම ගෙවීම සිදු කර ඇත්තේ ගොඩනැගිලි සැලසුම සකස් කිරීම සඳහා උපදේශන ආයතනයක් පත් කර ගැනීම, එම සැලසුම අනුමත කර ගැනීම, විදුලිය හා ජලය සැපයීමේ හැකියාව සොයා බැලීම, සම්මත උස අනුව ගොඩනැගිල්ලේ උස ආදිය සඳහා ගුවන් සේවා අධිකාරියෙන්ද අදාල අවසරයන්, අනුමතීන් හා වාර්තා ලබාගැනීම යනාදි කරුණු සඳහාය. මණ්ඩලයට අයත් වොක්ෂෝල් පටුමග ඉඩමෙහි නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අංක 16/2468/719/150 සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර ඒ අනුව තෝරාගත් උපදේශන සමාගම හරහා ගොඩනැගිල්ලේ සැලසුම් අදියරේ කටයුතු සියල්ල අවසන් කරවාගෙන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ගොඩනැගිලි බලපත්‍රයද ලබා ගන්නා ලදී. මෙම වියදම් මූලික සැලසුම් අදියර සඳහා වූ වියදම් වන අතර, නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. උක්ත සඳහන් කල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් ලැබුණ අනුමැතිය අනුව සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් සහිතව සියළු වියදම් දරන ලදී . | අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ප්‍රකාරව ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කුලී පදනම මත ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ලබාගත් ගොඩනැගිල්ල සඳහා මූලික තැන්පතුවක් ලෙස වසරක කුලී මුදල් රු.97,429,500 ක් ගොඩනැගිලි හිමිකරු වෙත ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව, වසරකින් පසු එළඹෙන වසර තුළ එම මූලික තැන්පතුවෙන් සියයට 35 ක් මාසික කුලී මුදලට හිලව් කළ යුතු වේ. ඒ අනුව ගිවිසුම් කාලය අවසන්වීමේදී ගොඩනැගිලි හිමිකරු වෙත රු.63,329,175 ක තැන්පතු මුදලක් ඉතිරිවන අතර, එම මුදල ගොඩනැගිල්ල බාරදීමෙන් අනතුරුව දින 30 ක් තුළ ගොඩනැගිලි හිමිකරු විසින් මණ්ඩලයට ගෙවිය යුතු විය. මෙම තැන්පතුවලට අමතරව ගිවිසුමෙහි 8(b) ඡේදය ප්‍රකාරව, නොගෙවූ ගොඩනැගිලි කුලී, දුරකථන, ජල හා විදුලි ගාස්තු යනාදිය වෙනුවෙන් තවත් මාස 03 ක කුලී මුදලට සමාන ආරක්ෂිත තැන්පතුවක් ලෙස රු.24,357,375 ක් ගොඩනැගිලි හිමිකරු වෙත ගෙවා තිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කුලී පදනම මත ලබා ගත් ගොඩනැඟිල්ල සඳහා වසරක අත්තිකාරම් මුදලක් ලබා දීමටත්, එය ගිවිසුම් ගත දෙවැනි වර්ෂයේ සිට මාසික මුදලින් 35% පමණ අය කර ගැනීමටත් තාක්ෂණික කමිටු නිර්දේශ මත අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමත කර ඇත. | ගිවිසුම්ගත වීමේදී මණ්ඩලයට වාසිදායක කොන්දේසි මත සිදු කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවන ලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල, මණ්ඩලයට ආපසු අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද, එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි. | විශ්‍රාමික නිලධාරීන් හට ගෙවන ලද රු.7,392,287 ක් වන පාරිතෝෂික මුදල් අයකර ගැනීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගත් අතර විශ්‍රාමික නිලධාරීන්හට පාරිතෝෂික මුදල් දීම ත්‍යාගයක් ලබාදීමක් ලෙස සැලකෙන බැවින් ඔවුන් ප්‍රතිපූරණය නොකරන්නේනම් එකී මුදල් අයකර ගැනීමට හැකියාවක් නොමැති බවට එවකට පත්ව සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. | අදාල මුදල් නැවත අයකර ගැනීමේ අවශ්‍යතාවය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ ලියාපදිංචි අලෙවි නියෝජිතයන් සංඛ්‍යාව 114 ක් වුවද, ඉන් 43 දෙනෙකුගෙන් පමණක් බැංකු ඇපකර ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය . | මණ්ඩලයේ දිස්ත්‍රික් අලෙවි නියෝජිත ධුරයක් ලබා ගැනීමේදී වර්තමානයේ පවතින නීති රීති වලට අනුව මිලියනයක බැංකු ඇපකරයක් තැබීම අනිවාර්යය වුවද පැරණි දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් සඳහා එය අනිවාර්යය කරුණක් නොවීය. නමුත් වර්තමානයේදි ප්‍රතිපත්තියක් වශයෙන් 2018 වසරේ සිට මේ දක්වා නව බඳවා ගැනීම් සියල්ල සඳහා මිලියනයක බැංකු ඇපකර ලබාගෙන ඇත. තවදුරටත් මෙය ක්‍රියාවට නැංවීමේ අරමුණින් පැරණි දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් මියගිය අවස්ථාවන්හිදි ඉතා උපක්‍රමශීලීව ඔවුන්ගේ දිස්ත්‍රික් අලෙවි නියෝජිතධුරය පැවරීමේදි රුපියල් මිලියනයක බැංකු ඇපකර ලබා ගැනීමට කටයුතු සිදු කොට ඇති අතර, බැංකු ඇපකර තැබීමට අපොහොසත් වන්නේ නම් එවැනි පැවරීම් සිදු නොකරයි. බැංකු ඇපකර තබා නොමැති පැරණි (සක්‍රීය) දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් ඉදිරියේදී අදියර වශයෙන් මෙම ප්‍රවාහයට එක් කර ගැනීමට කටයුතු සැලසුම් කර ඇත. | බැංකු ඇපකර ලබාගෙන නොමැති අලෙවි නියෝජිතයින්ගෙන් බැංකු ඇපකර ලබාගැනීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ මුළු ණයගැති වටිනාකම රු.137,704,393 ක් වු අතර, ඉන් සියයට 22 ක් හෙවත් රු.29,771,317 ක වටිනාකමැති ණයගැතියන්ගෙන් පමණක් බැංකු ඇපකර ලබාගෙන තිබුණි . | ආරම්භයේදී අලෙවි නියෝජිතයන් සඳහා බැංකු ඇපකර ලබාගෙන නොමැති අතර, වර්තමානයේ අලෙවි නියෝජිත පත්වීම් ලබාදීමේදී බැංකු ඇපකර ලබාගැනීම අනිවාර්ය වේ. බොහෝ අලෙවි නියෝජිතයන් විසින් ටිකට්පත් මුදලට මිලදී ගන්නා අතර, කඩිනමින් අලෙවි ඉලක්ක සපුරා ගැනීම සඳහා විශේෂ ලොතරැයි දිනුම් ඇදීමේදී බැංකු ඇපකර සලකා බැලීමකින් තොරව ලොතරැයිපත් අලෙවි කිරීම සඳහා | බැංකු ඇපකර ලබාගෙන නොමැති අලෙවි නියෝජිතයින්ගෙන් බැංකු ඇපකර ලබාගැනීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය. |

| | | |
|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කටයුතු කරනු ලබයි. මෙම ණය මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කර ගනු ලබයි. | |
| (ඇ) 2020 වර්ෂය තුළ මුද්‍රණය කරන ලද ලොතරැයිපත් වර්ග 10 අතුරින්, වර්ෂය තුළ සියයට 9 සිට සියයට 18 දක්වා පරාසයක් තුළ ලොතරැයිපත් නොවිකිණී ඉතිරිව පැවතුණි. මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ විකුණුම් අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය නොකිරීම මෙම අතිරික්තයට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ලොතරැයිපත් වර්ග 10 ට අදාලව, වර්ෂය තුළ ටිකට්පත් 116,045,964 ක ප්‍රමාණයක් නොවිකිණී ඉතිරිව පැවතුණි. වාර්ෂිකව ඒ වෙනුවෙන් දරන ලද මුද්‍රණ වියදම පමණක් රු.45,998,592 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය අවසන්වන විට නියෝජිතයින් වෙත බෙදා නොහැර, ගබඩාව තුළ ඉතිරිව තිබූ ලොතරැයිපත් තොග ප්‍රමාණය 23,257,800 ක්වූ අතර, එම ලොතරැයිපත්වල සෘජු මුද්‍රණ වියදම රු.8,710,976 ක් විය. | මේ තත්ත්වයට බලපා ඇති ප්‍රධානතම හේතුව ලෙස මාර්තු මාසයේ 10 වන දින සිට ක්‍රමානුකූලව වර්ධනය වූ කොවිඩ් ව්‍යාප්තිය සහ ඊට පසුව මාර්තු මස 20 වන දින සිට මැයි මස 18 වන දින දක්වා පනවන ලද සංචරණ සීමා දැඩි කිරීම වේ. විශේෂයෙන්ම සංචරන සීමා මැයි 18 සිට බොහෝ ප්‍රදේශයන්හි ඉවත් කලද පාරිභෝගික ඉල්ලුමේ සහ අලෙවිය සඳහා අලෙවි ජාලය ලොතරැයිපත් ලබා ගන්නා ආකාරයන්හි නිරන්තර උච්චාවචන තත්ත්වයන් ඇති වීම මත පාලනය කළ නොහැකි ආකාරයෙන් ආපසු එවුම් සහ ගබඩාවේ ඉතිරි ලොතරැයිපත් තොගය ඉහළ යන ලදී .තවද, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ විශාල ලෙස මුද්‍රණය ගැටලුපැවතීම හා ලොතරැයි පත් ප්‍රමාද වී ලැබීම මත ඉතිරි වූ ප්‍රමාණය වැඩි වීමසිදුවිය. | විකුණුම් අවශ්‍යතාවය හා බෙදාහැරීමේ ක්‍රියාවලිය පිළිබඳව නිවැරදි පුරෝකථනයක් සිදු කර ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කිරිමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ වොක්ෂොල් වීදියේ පිහිටි ඉඩමේ ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් ආරම්භ කර තිබූ ගොඩනැගිලි ඉදිකිරීම් සංචිත අරමුදලෙන් රු.මිලියන 550 ක් 2016 වර්ෂයේදී භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණද, එම වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ගොඩනැගිලි සංචිත අරමුදල වෙත ලැබිය යුතු වටිනාකමක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ 2020 දෙසැම්බර් 31 | මෙම මුදල මණ්ඩලය වෙත ලබා දෙන පදනම මත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත .ඒ බැව් එවකට සිටි සභාපතිතුමිය විසින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත 2016.09.19 දින යවන ලද ලිපිය අනුව තහවුරු වේ. | මහා භාණ්ඩාගාරයෙන් ශේෂ සනාථ කිරීමක් ලබාගෙන ඒ අනුව විධිමත් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| | දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ, ජාතික ලොතරැයි මණ්ඩලය වෙත ගෙවිය යුතු එවැනි ශේෂයක් ඇතුළත් වී නොතිබුණි. | | |
| (ආ) | ණයගැතියන් 05 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.7,169,678 ක්වූ ණය වටිනාකම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ නමුදු, මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයන් සමඟ සිදු කළ ගනුදෙනු සම්බන්ධයෙන් තබාගෙන ඇති වාර්තාවල අසම්පූර්ණතාවයන් හේතුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග මඟින් ණය අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය. | මෙම ණයගැතියන් වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර , අධිකරණයේ තීන්දුව ප්‍රකාශයට පත්වන තෙක් ණය අයකර ගැනීමේ අවදානම පිළිබඳව නිශ්චිතව කිව නොහැක . | නීති උපදෙස් ලබාගෙන ඒ අනුව අයකර ගැනීමේ හැකියාව නිශ්චය කර විධිමත් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුළු වියදමින් සියයට 53 ක් හෙවත් රු.893,002,443 ක් විකුණුම්, අලෙවි සහ බෙදාහැරීම් වියදම් වූ අතර, වූ එම වියදමින් සියයට 81 කට ආසන්න අගයක්, අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් විය. එසේම අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් සමස්ථ වියදමින් සියයට 43 ක අගයක් ගෙන තිබුණි. | ශ්‍රී ලංකාවේ ලොතරැයි ව්‍යාපාරය තුළ සමස්ත වශයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය යන රාජ්‍ය ව්‍යවසායන් දෙක පමණක් වෙළඳපල තුල ක්‍රියාකාරිව පවතී. ලොතරැයි යනු පාරිභෝගිකයා හට අත්‍යාවශ්‍ය භාණ්ඩයක් නොවේ. ලොතරැයි අලෙවියේදී ප්‍රචාරණය භාවිතා කරමින්, අනාගත වාසනාවන්ත අවස්ථාවන් පිළිබඳ බලාපොරොත්තු පාරිභෝගිකයා තුළ ඇතිකරවමින් නිරන්තරයෙන් පාරිභෝගිකයා පෙළඹවිය යුතුය. මේ සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරිය යුතුය. මෙම තත්ත්වය ලෝක ලොතරැයි කර්මාන්තය තුළද හඳුනාගත හැකිය. බිම්මට්ටමින් පාරිභෝගිකයන් අභිප්‍රේරණය කිරිම සඳහා අලෙවි උපක්‍රමයන් ලෙස පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට සිදුවන අතර ඒ සඳහා යම් යම් ප්‍රවර්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා වියදම් දැරිය යුතුය. අලෙවි ජාලයේ සාමාජිකයන් අභිප්‍රේරණය සඳහාද ඉහත ආකාරයෙන්ම කටයුතු කිරීමට සිදුවන අතර එයට අමතරව සාමාන්‍ය අලෙවි කොමිස් මුදල් ලෙස සහ යම් යම් අවශ්‍යතාවයන්හිදී විශේෂ අලෙවි කොමිස් මුදල් ලෙස සැලකිය යුතු මුදලක් වැයවේ. මෙම සියලු වියදම් වෙළඳපල යථාර්තයන් වන අතර කුමන ආකාරයේ වෙළඳපලකදීද මෙම | විකුණුම් ආදායම හා වියදම පිළිබඳ විධිමත් විශ්ලේෂණයක් සිදු කර ආර්ථිකමය වශයෙන් වඩාත් වාසිදායක අයුරින් විකුණුම් ප්‍රවර්ධන වියදම් දැරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

වියදම් වලින් වැලකිය නොහැක. මෙම වියදම් කපා හැරීම මගින් කෙටිකාලීනව ලාභය වැඩි කරගැනීමත් සිදු කළ හැකි වුවද එය දිගුකාලීනව සිදු වුවහොත් වෙළෙඳපල බිඳ වැටීමට ලක්වීම අනිවාර්ය වෙයි. බෙදාහැරීම් වියදම් අවමකර ගැනීම කෙරෙහි අවධානය යොමුව ඇති අතර බෙදාහැරීමේ සේවාවක් මඟින් දීප ව්‍යාප්ත ලොතරැයි බෙදාහැරීම ආරම්භ කර ඇත. එමඟින් බෙදාහැරීමේ වියදමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අඩු කර ගැනීමට අපේක්ෂා කරයි. ලොතරැයි මණ්ඩල වලින් සිදුකෙරෙන ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම්හි අවශ්‍යතාවය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අවධානය යොමුව ඇති අතර වසර 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරණ චක්‍රලේඛය ප්‍රකාරව ලොතරැයි ආදායමින් 10% ක ප්‍රතිශතයක් දක්වා වියදම් කිරීමට අවසර ලබාදී ඇත. එසේම ජනාධිපති ලේකම්තුමන්ගේ වසර 2020 දෙසැම්බර් 10 දිනැති අංක PS/GPA/Circular/36/2020 දරණ චක්‍රලේඛය මඟින්ද ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම් සඳහා පෙර වසරේ ආදායමින් 10% ක සීමාව නොඉක්ම වනසේ වියදම් කිරීමට අවසර ලබාදී ඇත. මේ ලොතරැයි සම්බන්ධයෙන් වන ප්‍රචාරණ අවශ්‍යතාවයේ සුවිශේෂී තත්ත්වය මැනවින් වටහාගෙන සිදුකරන ලද අවසර ලබාදීමකි. කෙසේ වෙතත් තම ලාභය උපරිම කර ගැනීමේ අරමුණින් මණ්ඩලය සාමාන්‍යයෙන් තම ආදායමින් 5% ක ප්‍රමාණයක් පමණක් වාර්ෂික ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම් සඳහා ඵලදායි ලෙස වැය කරයි.

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් තෑගි ලෙස ලබාදීම සඳහා මිලදී ගන්නා ලද එකතුව රු.8,764,996 ක් වටිනා මෝටර් කාර්, බයිසිකල් ඇතුලු වාහන 06 ක් සහ අනෙකුත් තෑගි භාණ්ඩ 05 ක් මාස 04 සිට වසර 05 දක්වා කාලයක් එම අවශ්‍යතාවයන්ට උපයෝජනය නොකර, නිෂ්ක්‍රියව ගබඩාවේ තිබුණු බව නිරීක්ෂණය වූ අතර, එයින් ඇතැම් තෑගි භාණ්ඩවල වගකීම් කාලයද ඉක්මවා තිබුණි. | විශේෂ දිනුම් වාරයන්හි අතිරේක ත්‍යාගයන් ලෙස ලබාදීමට අවශ්‍ය ත්‍යාග භාණ්ඩ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි මිලදී ගැනීම සිදු කෙරේ. සමහර දිනුම් වාරයන්හි අතිරේක ත්‍යාග ජයග්‍රහකයින් බිහිවුවද ජයග්‍රහකයින් ඉදිරිපත් නොවීම මත එම අතිරේක ත්‍යාග වෙනුවෙන් මිලදී ගනුලබන භාණ්ඩ ත්‍යාග ගබඩාවේ ඉතිරි වේ. එවැනි අවස්ථාවන්හිදී නියමිත කාලය තුල ජයග්‍රහකයින් ඉදිරිපත් නොවන භාණ්ඩ ඉදිරියේදී ලොතරැයි ත්‍යාග සඳහා යොදා ගැනීමට කටයුතු කරයි. නමුත් මේ ආකාරයෙන් ඉතිරි වන ත්‍යාග භාණ්ඩ නැවත නැවත ඉදිරි දිනුම් වාරයන් වෙනුවෙන් යොදා ගැනීම සිදුකළද අදාළ ලොතරැයිය මගින් ඉලක්ක ගත පාරිභෝගික පිරිස, අදාළ ලොතරැයි දිනුම් ඇදීම පවත්වන කාලය සහ එම ත්‍යාග භාණ්ඩයන්හි පිරිවැය ආදී සාධක මත ඉතිරිවන ත්‍යාගභාණ්ඩ අදාළ කාලසීමාව ඉක්ම වූ සැනින්ම වෙනත් විශේෂ වාරයක් සඳහා යොදා ගැනීම සම්බන්ධව ප්‍රායෝගික අපහසුතාවයන් ඇතිවේ. එවැනි අවස්ථාවලදී ජයග්‍රහකයින්ට ඉදිරිපත් වීමට ලබාදී ඇති මාස 6ක කාලය ඉක්මවා යන දිනයත් එම ත්‍යාග භාණ්ඩ විශේෂ දිනුම් වාර සඳහා නැවත යොදා ගන්නා දිනයත් අතර කාල පරාසයක් පවතින අතර එතෙක් එවැනි ත්‍යාග භාණ්ඩ ගබඩාවේ ඉතිරි පවතී. | නිෂ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම් කල් ඉකුත්වීමට/ විනාශ වීමට පෙර උපයෝජනයට කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව මණ්ඩලයේ අලෙවි/ප්‍රවර්ධන නිලධාරී ලෙස තනතුරක් ඇතිකර තිබුණි. එම තනතුර සඳහා නිශ්චිතව සුදුසුකම් සඳහන් කිරීමෙන් තොරව කළමනාකරණ සහකාර තනතුරක් දරන අයෙකු 2017 අගෝස්තු 08 දින සිට පත්කර තිබුණි. කෙසේ වුවද එම තනතුරට පත් කළ නිලධාරියාගේ වැටුප් වර්ධක 03 ක් විලම්භනය කරන ලෙස නියෝග කර තිබියදී එසේ කටයුතු කිරීමකින් තොරව එම නිලධාරියා 2020 ජනවාරි මස විශ්‍රාම යනතුරු නව තනතුරේ වැටුප් ගෙවා තිබුණි. | විශ්‍රාම යාමට ආසන්නව සිටි පැරණි සේවකයින් අභිප්‍රේරරණය කිරිමේ අරමුණ හා ආයතනයේ රාජකාරී අවශ්‍යතාවය මත අනුමත තනතුරු සංඛ්‍යාව තුල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තාවකාලිකව තනතුරු නාමය වෙනස් කර උසස් වීම් ලබා දී ඇත. | භාණ්ඩාකාර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

**4.1 වාර්ෂික වාර්තාවපාර්ලිමේන්තුවේ සභාගතකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2021 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම පිණිස 2021.06.22 දින මුදල් අමාත්‍යාංශයට යොමු කර ඇත. | වාර්ෂික වාර්තාව නියමිත පරිදි පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |